# දකුණු පළාත් සභාව

தென் மாகாண சபை

# SOUTHERN PROVINCIAL COUNCIL

## අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

கல்வி,காணி மற்றும் காணி அபிவிருத்தி, லைகவ் மற்றும் தகவல்நெடுஞ்சா துறை அமைச்சு

Ministry of Education, Land & Land Development, Highways & Information

**බිම් මහල ,"දක්ෂිණ පාය", ලබුදූව, ගාල්ල.** கீழ் மாடி, "தக்சிண பாய", லபுகுவ, காலி, Ground Floor, "Dakshina Paya", Labuduwa,Galle.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My NO. | Sp/Edumin/Edu/4/2 | ඔබේ අංකය<br>உமது இல.<br>Your NO. | | දිනය<br>திகதி<br>Date | 2023.11.15 |

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සියලුම අධ්‍යාපනවේදී උපාධිධාරීන් වෙත,

<u>අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවාගැනීම.</u>
<u>සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයන් සඳහා කැඳවීම.</u>

උක්ත කරුණට අදාළව ඔබ විසින් යොමු කරන ලද අයදුම්පත් සලකා බැලීමෙන් අනතුරු ව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයන් **2023.11.21,22 සහ 23 දිනයන්හි පෙ.ව.09.00 සිට දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේදී** (පළමු මහල, දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණය, ලබුදූව, ගාල්ල.) පැවැත්වේ. ඒ අනුව එදිනට පහත සඳහන් සහතික හා ලිපිලේඛනවල මුල් පිටපත් සමග සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලෙස ඔබට මෙයින් දන්වමි. එමෙන්ම එම සහතිකයන්හි ඡායා පිටපත්, ඔබ විසින් සත්‍ය පිටපත් බවට සහතික කර පහත අනුපිළිවෙළ අනුව කාඩ්බෝඩ් ලිපිගොනුවක සකස් කර රැගෙන ආ යුතු අතර, එහි **ඔබේ නම, ඔබේ අංකය** (වෙබ් අඩවියෙහි පළ කර ඇති ඔබේ නමට අදාළ අනු අංකය) හා **පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

1. ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය (නමේ වෙනසක් ඇතොත් දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය.)
2. අ.පො.ස.(සා.පෙළ/උ.පෙළ) සහතිකවල මුල්පිටපත්
3. විස්තර සහිත උපාධි සහතිකයේ මුල් පිටපත් (Detail Certificate and Degree Certificate)
4. මාස 06 ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක් (**මින් එකක් ඔබ පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීගෙන් ලබා ගත යුතු ය. එහි ඔබේ ලිපිනය හා පදිංචිය කවදා සිට ද යන වග සඳහන් විය යුතුය.**)
5. ඔබගේ පදිංචිය තහවුරු වන පරිදි ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතුය. එහිදී ඔබ අයදුම් කරනු ලබන්නේ කලත්‍රයාගේ පදිංචිය මත නම් කලත්‍රයාගේ පදිංචිය තහවුරු වන ග්‍රාම නිලධාරී සහතිකය සමග විවාහ සහතිකය ඉදිරිපත් කළ යුතු වේ.
6. එමෙන්ම ඉහත දක්වා ඇති සියලුම ලේඛන සුදුසුකම් පරීක්ෂණ දිනයේදීම ඉදිරිපත් කළයුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන කිසිවක් භාරගනු නොලැබේ.
7. ඔබ විසින් පුහුණුව ලද විෂයයට අදාළ ව පහතින් දක්වා ඇති පරිදි මිනිත්තු 05ක කාලයක් තුළ තෝරා ගත් මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතු ය.
8. විභාග නිවේදනයේ සඳහන් කර ඇති පරිදි සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමට පෙර එදින විභාග ගාස්තු ලෙස රු.400/- ක මුදලක්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සරප් නිලධාරී වෙත ගෙවිය යුතු අතර අදාළ රිසිට් පත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වේ.
9. සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබට නියමිත වේලාවට මිනිත්තු 15 කට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැමිණීම අනිවාර්යය වේ.
10. සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයන් සඳහා කැඳවීම, පත්වීම් ලබා දීම සඳහා සුදුසුකමක් ලෙස කිසිසේත් නොසැලකිය යුතු ය.

රංජිත් යාපා
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත

රංජිත් යාපා
ලේකම්.


**ගරු අමාත්‍යතුමා** கௌரவ அமைச்சர் Hon. Minister: 091-2246159
**ලේකම්** செயலாளர் Secretary: 091-2246156, 091-2030701
**කාර්යාලය** காரியாலயம் Office: 091-2030708 **පාලන**/நிர்வாகம்/Administration; 091-2030705 **අධ්‍යාපන**/கல்வி/Education; 091-2030703
**ෆැක්ස්** பெக்ஸ்: 091-2246157, 091-2246156

**ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය:**

(i). ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි 5කට නොඅඩු කාලයක් ලබා දෙනු ලබන අතර නිර්ණායකයන්හි අරමුණු පහත පරිදි වේ.

**නිර්ණායකයන්හි අරමුණු:**

| | | |
|---|---|---|
| i | අරමුණ හා ප්‍රවිශ්ට වීම | සාර්ථකව පාඩමෙහි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම. |
| ii | පෞරුෂය හා හඬ පාලනය | ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ හැකියාව ඇගයීම. |
| iii | සන්නිවේදනයේ පැහැදිලි බව | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම. |
| iv | කාල කළමනාකරණය | ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණු කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම. |
| V | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | අරමුණු කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිත කිරීමේ හැකියාව ඇගයීම. |

(ii). ඔබ විසින් සිදු කරනු ලබන ඉදිරිපත් කිරීම සඳහා Microsoft PowerPoint Presentations කිසිසේත් යොදා ගත නොහැකි අතර පංති කාමර තුල සිදු කෙරෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය අනුව ඉගෙනුම් උපකරණ භාවිතා කරමින් ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වේ.

(iii). මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අරමුණු හා ප්‍රවිශ්ට වීම. | 05 | 02 |
| 02. | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03. | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04. | කාල කළමනාකරණය | 05 | 02 |
| 05. | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |